මාධ්‍ය නිවේදනය
සන්නිවේදන දෙපාර්තමේන්තුව, 30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
+94 11 2477424 / +94 11 2477669 +94 11 2346304
communications@cbsl.lk / dcommunications@cbsl.lk www.cbsl.gov.lk

ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

| | |
|---|---|
| නිකුත් කළේ | මූල්‍ය බුද්ධි ඒකකය |
| දිනය | 2024 පෙබරවාරි 19 |

**මූල්‍ය බුද්ධි ඒකකය විසින් 2023 සැප්තැම්බර් මස 27 වන දින සිට දෙසැම්බර් මස 31 වන දින දක්වා වූ කාලපරිච්ඡේදය තුළ මූල්‍ය ආයතන සඳහා පරිපාලනමය දණ්ඩන පැනවීම**

2006 අංක 06 දරන මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ පනතේ 19(1) සහ 19(2) වගන්ති මගින් පැවරී ඇති බලතල අනුව එම පනතේ විධිවිධාන වලට අනුකූල නොවන ලෙස ක්‍රියා කරන ආයතන සඳහා මූල්‍යමය දණ්ඩන පනවනු ලැබේ. අදාල අනුකූල නොවන කටයුතුවල ස්වභාවය හා බරපතලකම සැලකිල්ලට ගෙන මෙම දණ්ඩන නියම කල හැකිය.

ඒ අනුව, ශ්‍රී ලංකාවේ මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ නියාමන ආයතනය ලෙස මූල්‍ය බුද්ධි ඒකකය විසින් මූල්‍ය ආයතනවල අනුකූලතාවය බලාත්මක කිරීම සඳහා 2023 සැප්තැම්බර් මස 27 වන දින සිට දෙසැම්බර් මස 31 වන දින දක්වා වූ කාලපරිච්ඡේදය තුළ පහත දක්වා ඇති පරිදි එකතු කරගන්නා ලද සමස්ත දඩ මුදල රුපියල් මිලියන 14 කි. එලෙස දණ්ඩන මගින් එකතු කරගන්නා ලද මුදල ඒකාබද්ධ අරමුදලට බැර කරන ලදී.

1. **එම් එම් බී එල් මනි ට්‍රාන්ස්ෆර් (ප්‍රයිවට්) ලිමිටඩ්**

**දණ්ඩනය පනවන ලද දිනය** : 2023 නොවැම්බර් 03

**වටිනාකම** : රු. 1,000,000.00 (රුපියල් මිලියනයකි)

**දණ්ඩනය ගෙවන ලද දිනය** : 2023 නොවැම්බර් 14

**දණ්ඩනය පැනවීමට හේතුව** : 2006 අංක 06 දරන මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ පනතට සහ 2016 අංක 01 දරන මූල්‍ය ආයතන (ගණුදෙනුකරුවන් පිළිබඳ නිසි උද්යෝගයෙන් ක්‍රියාකිරීමේ) රීතීන්ට අනුව ආයතනයේ නියෝජිතයන්ගේ ක්‍රියාකාරකම් නියාමනය කිරීමට සහ ඔවුන් රටෙහි පවතින මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ අවශ්‍යතාවන්ට අනුව කටයුතු කරන්නේද යන්න තහවුරු කර ගැනීම සඳහා යාන්ත්‍රණයක් ක්‍රියාත්මක කිරීමට අපොහොසත් වීම හේතුවෙන් මෙම පරිපාලනමය දණ්ඩනය පනවන ලදී.

**2. ලංකා බැංකුව**

**දණ්ඩනය පනවන ලද දිනය** : 2023 නොවැම්බර් 07

**වටිනාකම** : රු. 6,000,000.00 (රුපියල් මිලියන හයකි)

**දණ්ඩනය ගෙවන ලද දිනය** : 2023 නොවැම්බර් 21

**දණ්ඩනය පැනවීමට හේතුව** : පහත දැක්වෙන පරිදි 2006 අංක 06 දරන මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ පනතෙහි සහ 2016 අංක 01 දරන මූල්‍ය ආයතන (ගණුදෙනුකරුවන් පිළිබඳ නිසි උද්යෝගයෙන් ක්‍රියා කිරීමේ) රීතීන්හි අවශ්‍යතාවන්ට අනුකූල නොවීම හේතුවෙන් මෙම පරිපාලනමය දණ්ඩනය පනවන ලදී.

- දේශපාලන වශයෙන් අනාවරණය වූ තැනැත්තන් සමග ව්‍යාපාරික සම්බන්ධතාවයන් ඇති කරගන්නා ඇතැම් අවස්ථාවන්හිදී ආයතනයේ ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වයේ අනුමැතිය ලබාගැනීමට අපොහොසත් වීම සහ එවැනි අනුමැතීන් ලබාගැනීමේදී සැළකිය යුතු ප්‍රමාද වීම් පැවතීම.
- එක්සත් ජාතීන්ගේ සම්මේලනයේ ආරක්ෂක මණ්ඩලයේ සම්මත වූ යෝජනා අංක 1373 ට අනුව 2012 අංක 01 දරන එක්සත් ජාතීන්ගේ නියෝගයන්හි ඇතුලත් අංක 4(7) නියෝගය යටතේ නමෝද්දිෂ්ට තැනැත්තන්ට, එකී නියෝගයන්හි ඇතුලත් අංක 05 දරන නියෝගයට සහ නිසි බලධාරියා විසින් ප්‍රකාශයට පත් කරන ලද 2014 මැයි 22 දිනැති අංක 1863/25 දරන අති විශේෂ ගැසට් නිවේදනයේ ප්‍රකාශයට පත් කරන ලද නියෝගයට අනුව, කිසිදු ගනුදෙනුවක් සිදු කිරීම වළක්වා ගැනීමට සහ ඔවුන්ගේ අරමුදල්, මූල්‍ය වත්කම් හෝ ආර්ථික සම්පත් ප්‍රමාදයකින් තොරව ක්‍රියා විරහිත කිරීමට අපොහොසත් වීම.
- මූල්‍ය බුද්ධි ඒකකය විසින් සියලුම බලපත්‍රලාභී බැංකු සහ බලපත්‍රලාභී මූල්‍ය ආයතන වෙත නිකුත් කරන ලද 'මූල්‍ය බුද්ධි ඒකකය/එක්සත් ජාතීන්ගේ සම්මේලනයේ ආරක්ෂක මණ්ඩලයේ සම්මත යෝජනා/විධාන අංක 1' (FIU/UNSCR/Directives No. 1) හි අවශ්‍යතාවන්ට අනුව නමෝද්දිෂ්ට තැනැත්තන් සතු අරමුදල්, මූල්‍ය වත්කම් හෝ ආර්ථික සම්පත් පිළිබඳ සම්පූර්ණ තොරතුරු නොපමාව මූල්‍ය බුද්ධි ඒකකය වෙත දැනුම් දීමට අපොහොසත් වීම.

**3. මහජන බැංකුව**

**දණ්ඩනය පනවන ලද දිනය** : 2023 නොවැම්බර් 09

**වටිනාකම** : රු. 7,000,000.00 (රුපියල් මිලියන හතකි)

**දණ්ඩනය ගෙවන ලද දිනය** : 2023 නොවැම්බර් 22

**දණ්ඩනය පැනවීමට හේතුව** : පහත දැක්වෙන පරිදි 2006 අංක 06 දරන මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ පනතෙහි සහ 2016 අංක 01 දරන මූල්‍ය ආයතන (ගණුදෙනුකරුවන් පිළිබඳ නිසි උද්යෝගයෙන් ක්‍රියා කිරීමේ) රීතීන්හි අවශ්‍යතාවන්ට අනුකූල නොවීම හේතුවෙන් මෙම පරිපාලනමය දණ්ඩනය පනවන ලදී.

- බැංකුව විසින්, ක්‍රියා විරහිත කළ ගිණුම් හරහා හර ගනුදෙනු සිදු කිරීම මගින් මූල්‍ය බුද්ධි ඒකකය විසින් නිකුත් කරන ලද ක්‍රියා විරහිත කිරීමේ නියමයන් සහ කොළඹ මහාධිකරණය විසින් 2006 අංක 06 දරන මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ පනතේ 15(3) වගන්තිය යටතේ පසුව දීර්ඝ කරන ලද නියමයන් වලට අනුකූල වීමට අපොහොසත් වීම.

- දේශපාලන වශයෙන් අනාවරණය වූ තැනැත්තන් සමග ව්‍යාපාරික සම්බන්ධතාවයන් ඇති කරගන්නා ඇතැම් අවස්ථාවන්හිදී ආයතනයේ ජ්‍යෂ්ඨ කළමනාකාරීත්වයේ අනුමැතිය ලබාගැනීමට අපොහොසත් වීම සහ එවැනි අනුමැතීන් ලබාගැනීමේදී සැළකිය යුතු ප්‍රමාද වීම් පැවතීම.
- එක්සත් ජාතීන්ගේ සම්මේලනයේ ආරක්ෂක මණ්ඩලයේ සම්මත වූ යෝජනා අංක 1373 ට අනුව 2012 අංක 01 දරන එක්සත් ජාතීන්ගේ නියෝගයන්හි ඇතුලත් අංක 4(7) නියෝගය යටතේ නමෝද්දිෂ්ට තැනැත්තන්ට, එකී නියෝගයන්හි ඇතුලත් අංක 05 දරන නියෝගයට සහ නිසි බලධාරියා විසින් ප්‍රකාශයට පත් කරන ලද 2014 මැයි 22 දිනැති අංක 1863/25 දරන අති විශේෂ ගැසට් නිවේදනයේ ප්‍රකාශයට පත් කරන ලද නියෝගයට අනුව, කිසිදු ගනුදෙනුවක් සිදු කිරීම වළක්වා ගැනීමට සහ ඔවුන්ගේ අරමුදල්, මූල්‍ය වත්කම් හෝ ආර්ථික සම්පත් ප්‍රමාදයකින් තොරව ක්‍රියා විරහිත කිරීමට අපොහොසත් වීම.
- මූල්‍ය බුද්ධි ඒකකය විසින් සියලුම බලපත්‍රලාභී බැංකු සහ බලපත්‍රලාභී මූල්‍ය ආයතන වෙත නිකුත් කරන ලද 'මූල්‍ය බුද්ධි ඒකකය/එක්සත් ජාතීන්ගේ සම්මේලනයේ ආරක්ෂක මණ්ඩලයේ සම්මත යෝජනා/විධාන අංක 1' (FIU/UNSCR/Directives No. 1) හි අවශ්‍යතාවන්ට අනුව නමෝද්දිෂ්ට තැනැත්තන් සතු අරමුදල්, මූල්‍ය වත්කම් හෝ ආර්ථික සම්පත් පිළිබඳ සම්පූර්ණ තොරතුරු නොපමාව මූල්‍ය බුද්ධි ඒකකය වෙත දැනුම් දීමට අපොහොසත් වීම.
- නමෝද්දිෂ්ට තැනැත්තන්ට අදාල ලැයිස්තු යාවත්කාලීන වන විට බැංකුවෙහි දැනට පවතින ගනුදෙනුකරුවන්ගේ දත්ත පරීක්ෂා නොකිරීම හේතුවෙන් එකී නමෝද්දිෂ්ට තැනැත්තන් අදාල ලැයිස්තු මගින් ඉවත් කලද ඔවුන්ගේ ගිණුම් ක්‍රියා විරහිත කිරීමට ගනු ලැබූ තීරණය වෙනස් කොට නැවත ක්‍රියාත්මක කිරීමට අපොහොසත් වීම.